# එකමුතුකම දිනූම යාළු



## තනූෂා තලේරත්න

# එකමුතුකම දිනුම යාළු

කතෘ :- .තනූෂා තලේරත්න

ISBN අංකය :- 978-624-206-986-9

කෘතිය පල කරන දිනය :- 2023/ 11 / 15

# පිදුම

මා සදාදර

සමන්මලී

ගුරු මවුනි,,,,

ඔබේ නාමයෙන්

පුදමි

බැති සිතින්

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයේ ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුතු බහුවිධ කුසලතාවයන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණ මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛණ කරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂී ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් **" දිවිය දිනන විද්‍යුත් පොතක් "** ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ **" දිවිය දිනන විද්‍යුත් පොතක් "** ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.


මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

.

**ශෂිකලා සේනාධීර**
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023 . 11 . 01

අපි හැමෝම මොනවා හරි ක්‍රීඩාවක් කරන්න ඕන. හැමෝම මොනවා හරි ක්‍රීඩාවකට දස්කම් පානවා.





දවසක් මම පාරේ දුවමින් හිටියා. එහෙම ඉන්නකොට මගේ ගුරුතුමී එතනින් ගිහින්. ගුරුතුමී දැකලා මම දුවමින් ඉන්න ආකාරය.

පසුවදා මම පාසලට ගියා ම ගුරුතුමී මට කිව්වා "පුතේ ඔයාට හොඳට දුවන්න පුළුවන්. ඔයා මලල ක්‍රීඩා කරන්න". අනිවාර්යයෙන්ම ඉදිරිපත් වෙන්න කියලා ගුරුතුමී මට අවවාද කළා.

ගුරුතුමීට අපූරු සිතුවිල්ලක් ආවා. ගුරුතුමී පංතිය ළඟ තිබුණු පුංචි ඉඩක අපිට දුවන්න ලෑස්ති කළා. මගේ ආරක්ෂාවට යාළුවෝ කිහිප දෙනෙකුත් එව්වා.

ඉස්සර තරඟ වලින් දුවලා දිනපු

යාළුවෝ මට කරදර කරයි

කියලා අදහසින් තමයි

යාළුවෝ කිහිප දෙනෙකුත්

එකතු කර ගත්තේ

අපි හැමෝම ගියා මලල ක්‍රීඩා පුහුණුවට. පළවෙනි දවසේ යාළුවෝ අනිත් යාළුවන්ට හොඳ තරඟයක් දුන්නා. පුහුණුවීම් ඉවර වෙලා හරිම සතුටින් අපි පංතියට ගියා ගුරුතුමීව බලන්න.



“අනේ .... මගේ දරුවනේ, ”

ගුරුතුමී අපිව තුරුළු කර



ගත්තා. ගුරුතුමීගේ ඇස් වලින් සතුටු කඳුළු වැටෙන්න පටන් ගත්තා.

යාළුවෝ තරඟ වලට එකතු

වුණේ මගේ ආරක්ෂාවට මිසක්

තරඟ වලින් දිනන්න ම හිතා

ගෙන නෙමෙයි.



ඒත්, ඔයාලා දන්නවාද අපි

හැමෝම දිස්ත්‍රික් තරඟ වලට

තේරුණා. ගුරුතුමීට ඒක දැන

ගත්තාම තිබුණු සතුට දෙගුණ

තෙගුණ වුණා.

ගුරුතුමී මට පෙන්නපු මග මම ඉස්සරහට ම ගිහින්, කවදා හරි ක්‍රීඩාවෙන් ඉදිරියට ම ගිහින් ලෝකය ම දිනා ගෙන මගේ ගුරුතුමීගේත්, පාසලේත් නම මම බබලනවා.

දන්වා ද යාළුවනේ ලෝකය දිනා ගෙන ඇවිත් මම ඉස්සෙල්ලා ම බලන්න යන්නෙ කවුද කියලා. මගේ ආදරණීය ගුරුතුමියවයි, මගේ යාළුවෝයි.



පුංචි අපිත් මොනවා හරි දස්කම්

පාලා හැමෝගෙම හිතට

සතුටක් ගේමු

ඒ වගේ ම අධිෂ්ඨානයෙන්

වැඩ කරමු. !

හරියට මම වගේ

තනූෂා තලේරත්න

# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු !

මෙයට

**සෙනවිරත්න මහලේකම්**

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023 . 11 . 01

**ISBN 978-624-206-986-9**